# SUNIL WATAGALA

Attorney- at – Law, Notary Public & Commissioner for Oaths
SCE No. A 11830
NO. 192, Hulftsdorp Street, Colombo 12.
Mobile: 0772349348, 0718458711
sunilwatagala@yahoo.ie


---

2024-08-21

තොරතුරු නිලධාරී,

ජනාධිපති ලේකම් කාර්යාලය,

ගාලුමුවදොර පාර, කොළඹ 01.

මහත්මයාණනි / මහත්මියනි,

<u>තොරතුරු දැනගැනීමේ පනත යටතේ කරනු ලබන ඉල්ලීමයි.</u>

මෑතකදී ගරු ශ්‍රේෂ්ඨාධිකරණය විසින් දෙන ලද තීන්දුවකට අනුව සිය මන්ත්‍රීධුර අහිමි වූ හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රීවරු සහ අමාත්‍යවරුන් වන හරින් ප්‍රනාන්දු මහතා සහ මනුෂ නානායක්කාර මහතා ජනාධිපතිවරයා විසින් ඔවුන් පෙර අමාත්‍යධුර දැරූ සංචාරක, ඉඩම්, ක්‍රීඩා සහ තරුණ කටයුතු සහ කම්කරු සහ විදේශ සේවා අමාත්‍යාංශවල උපදේශක තනතුරු සඳහා පත්කර ඇත.

2024.08.16 වන දිනැතිව හරින් ප්‍රනාන්දු මන්ත්‍රීවරයා වෙත ජනාධිපති විසින් නිකුත් කරන ලද පත්වීම් ලිපියේ එකී පත්කිරීම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41(1) වගන්තිය යටතේ සිදුකර ඇති බව සඳහන් කර ඇත.

1. ජනාධිපතිවරයා විසින් හරින් ප්‍රනාන්දු මහතා සංචාරක, ඉඩම්, ක්‍රීඩා සහ තරුණ කටයුතු අමාත්‍යාංශයේ උපදේශකයෙකු ලෙස සහ මනුෂ නානායක්කාර මහතා කම්කරු සහ විදේශ සේවා අමාත්‍යාංශයේ උපදේශකයෙකු ලෙස පත්කිරීම් වලට අදාලව අමාත්‍ය මණ්ඩලයේ අදහස් විමසා තිබේ ද?

2. එකී උපදේශක පත්කිරීම් සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී තිබේ ද?

එසේ අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇත්නම් එම අමාත්‍ය මණ්ඩල තීරණයේ පිටපතක් මා වෙත නිකුත් කරන මෙන් ඉල්ලා සිටිමි.

ස්තූතියි.

මෙයට,

නීතිඥ

සුනිල් වටගල එල්එල්.බී (කොළඹ)
SCE NO. A 11830
නීතිඥ, ප්‍රසිද්ධ නොතාරිස්,
සහ දිවුරුම් කොමසාරිස්
අංක 192, හල්ෆ්ට්ස්ඩෝප් වීදිය,
කොළඹ 12.
දු.ක. 071 8458 711, 077 2349 348
sunilwatagala@yahoo.ie